සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 2 |

**උපදෙස් : සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.**

- **අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතාම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.**

**01.** ක්‍රි.ව. 13 වන සියවසේ දී පමණ ඉන්දියාවේ විසූ විශිෂ්ඨතම සංගීතවේදියෙකි

**(1)** තාන්සේන් **(2)** දෂ්රාජ්සිං **(3)** සාරංගදේව

**(4)** අහෝබල **(5)** මාතාංගමුණි (...................)

**02.** පහත දැක්වෙන රාග යුගල අතරින් පූර්වාංවාදී රාග යුගලය තෝරන්න.

**(1)** ආසාවරී - දේස් **(2)** දේස් - තිලක්කාමෝද් **(3)** ජෞනපුරි - තිලක්කාමෝද්

**(4)** භෛරව - ආසාවරී **(5)** භෛරව - ජෞනපුරි (...................)

**03.** ගායන සමය අනුව උත්තරාංගවාදී රාග ගායනා කරනු ලබන්නේ,

**(1)** පෙ.ව. 10 සිට ප.ව. 4 තෙක් කාලය තුල ය.

**(2)** පෙ.ව. 7 සිට පෙ.ව. 10 තෙක් කාලය තුල ය.

**(3)** රාත්‍රී 12 සිට දිවා 12 තෙක් කාලය තුල ය.

**(4)** දිවා 12 සිට රාත්‍රී 12 තෙක් කාලය තුල ය.

**(5)** පෙ.ව. 6 සිට සවස 6 තෙක් කාලය තුල ය. (...................)

**04.** බාගේශ්‍රි රාගය සඳහා තාම්පුරාව සුසර කරන නිවැරදි ක්‍රමය වන්නේ,

**(1)** ප̣ ස ස ස̇ **(2)** ප̣ ස ප ස̇ **(3)** ම ස ප ස̇

**(4)** ධ̣ නි ස ම̣ **(5)** ම ස ස ස̇ (...................)

**05.** ස්වරයන්ගේ කම්පනයන් සමඟ ගයන වයන තානාලංකාර හඳුන්වන නම කුමක්ද?

**(1)** මිශ්‍ර තාන **(2)** බෝල් තාන **(3)** අලංකාරික තාන

**(4)** සරල තාන **(5)** ගමක් තාන (...................)

**06.** නාදයෙන් තොර ගීතයත් , නාදයෙන් තොර ස්වරයත් , නාදයෙන් තොර නැටුමකුත් නොමැතිවන අතර ඒ සියල්ල නාදය ආත්ම කොට ගෙන ඇති බව සඳහන් වන්නේ

**(1)** සංගීත රත්නාකරයේ ය. **(2)** බෘහත්දේශි ග්‍රන්ථයේ ය.

**(3)** ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ ය. **(4)** සංගීත සංහිතා කෘතියේ ය.

**(5)** සංගීත පරිජාත නම් කෘතියේ ය. (....................)

**07.** ත්‍රිතාලය සහ තිලවඩා තාලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

**(1)** තාල දෙකම පක්ඛාවාජායෙන් පමණක් වාදනය කෙරේ.

**(2)** ධ්‍රැපද් ධමාර් වැනි ගායනා සඳහා බෙහෙවින් වාදනය කෙරේ.

**(3)** තාල දෙකෙහිම විවෘත අක්ෂර පමණක් යොදා ගැනේ.

**(4)** තාල දෙකෙහිම තාල සංඥා සමානවම යෙදේ.

**(5)** තාල දෙකෙහිම විභාග වල යෙදෙන මාත්‍රා සංඛ්‍යාව එකිනෙක සමාන නොවේ. (....................)

**08.** සෝරට් රාග අංග හා ගෞඩ බිලාවල් අංග සම්මිශ්‍ර වූ රාගයක් ලෙස දැක්වන්නේ

**(1)** බාගේශ්‍රී **(2)** ජයජයවන්ති **(3)** භෛරව

**(4)** හංසධ්වනි **(5)** ආසවරී (....................)

**09.** රාගධාරී සංගීතයේදී ගායන සමය තීරණය සඳහා බලපාන ''සමය දර්ශක හෝ අද්ව දර්ශක'' ස්වරය ලෙස හැඳින්වෙන්නේ,

**(1)** සඩ්ජයයි. **(2)** රිෂභයයි. **(3)** ගාන්ධාරයයි.

**(4)** මධ්‍යමයයි. **(5)** පංචමයයි. (....................)

**10.** රාග ජාතිය පිළිබඳ මතබේද ඇති නිර්දේශිත රාගය කුමක්ද?

**(1)** ජයජයවන්නි **(2)** ආසාවරී **(3)** භෛරව

**(4)** බාගේශ්‍රී **(5)** හංසධ්වනි (....................)

- **අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් ස්වර ප්‍රස්ථාරය උපයෝගී කරගන්න.**

| | | | |
|---|---|---|---|
| රි ග | ප්‍රරි රිග රිස | ගප නිසං | සංනි පග රිස |
| X | 2 | 0 | 3 |

**11.** ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය සහ තාලය කුමක්ද?

**(1)** ජයජයවන්නි - ජප්තාල් **(2)** දේස් - ජප්තාල් **(3)** බාගේශ්‍රී - දීප්චන්දි

**(4)** දේස් - දීප්චන්දි **(5)** හංසධ්වනි - ජප්තාල් (....................)

**12.** මෙහි අවසාන තාල විභාග දෙකෙන් පිළිබිඹු වන තානලංකාර වර්ගය වන්නේ,

**(1)** ගමක් තාන **(2)** බෝල් තාන **(3)** ශුද්ධ තාන

**(4)** අලංකාරික තාන **(5)** මිශ්‍ර තාන (....................)

**13.** ස්වර ප්‍රස්ථාරයෙන් පිළිබිඹු වන රාගයට වඩාත් ගැලපෙන ප්‍රකාශය තෝරන්න.

**(1)** බිලාවල් මේලගත සම්පූර්ණ ජාති රාගයකි.

**(2)** ෂඩ්ජය හා මධ්‍යමය පිළිවෙලින් වාදි සංවාදි වේ.

**(3)** කර්ණාටක පද්ධතියට ආවේනික වන අතර මධ්‍යමය හා ධෛවත වර්ජිතය.

**(4)** අවරෝහණයේදී කෝමළ නිෂාදය යෙදේ.

**(5)** දිනයේ ප්‍රථම ප්‍රහරයේ ගායනය වාදනය කෙරේ. (....................)

**14.** නි̣ ස ග ම ධ̲ ධ̲ ප යන ස්වර ඛණ්ඩය අයත් රාගය

**(1)** සවස් කාලයේ ගායනය වාදනය කෙරේ.

**(2)** රිෂභය සහ ධෛවත යන ස්වර ආන්දෝලනය නොකරයි.

**(3)** පරමේල ප්‍රවේශක රාගයකි.

**(4)** ''ගමග'' යන ස්වර සංගතිය නිතර යෙදේ.

**(5)** උදය සන්ධි ප්‍රකාශ රාගයකි. (....................)

**15.** රාගධාරි සංගීතයේ ඇති සුවිශේෂ ලක්ෂණයක් වනුයේ,

**(1)** ස්වර සංවාද බහුලව යොදා ගැනීමයි.

**(2)** අවශ්‍ය තැන්හි සර්පිනාවෙන් chords වාදනය කිරීමයි

**(3)** රාග නියමයන්ට අනුව නිර්මාණාත්මකව ගායනයේ සහ වාදනයේ යෙදීමයි.

**(4)** අද්භූත බලවේග පිනවීම සඳහා වර්තමානයේ ද භාවිත කිරීමයි

**(5)** හෝලි උත්සවය මූලික කරගෙන ගායනා කිරීමයි (....................)

**16.** පණ්ඩිත් අනින්දෝ චැටර්ජි නම් ඉන්දියානු සංගීතඥයා,

**(1)** ධ්‍රැපද් ගායකයෙකි. **(2)** සිතාර් වාදකයෙකි. **(3)** සන්තූර් වාදකයෙකි.

**(4)** තබ්ලා වාදකයෙකි. **(5)** බටනලා වාදකයෙකි. (....................)

**17.** එක්තරා තාලයක විභාගවල යෙදෙන මාත්‍රා සංඛ්‍යා එකිනෙක වෙනස්වේ. එම තාලය,

**(1)** ඒක්තාලය වේ. **(2)** තිලවඩා තාලය වේ. **(3)** ධමාර් තාලය වේ.

**(4)** ත්‍රිතාලය වේ. **(5)** දීප්චන්දි තාලය වේ. (....................)

**18.** ඒකලව හා අනාඝාතාත්මකව ගැයෙන ගැමි ගී විශේෂයකි.

**(1)** නෙළුම් කවි. **(2)** කමත් කවි. **(3)** ගොයම් කවි.

**(4)** රබන් කවි. **(5)** පාරු කවි. (...................)

**19.** ''භාවික ගීත'' නම් කෘතිය රචනා කරන ලද්දේ,

**(1)** ප්‍රේමවංශ හපුවලාන මහතා **(2)** ආනන්ද ජයසිංහ මහතා

**(3)** විමල් අභයසුන්දර මහතා **(4)** වින්සන්ට් සෝමපාල මහතා

**(5)** බී. එස්. විජයරත්න මහතා (...................)

**20.** ''ආශාවරී මනමෝහිනී'' ගීතය සඳහා භාවිත වී ඇති රාගය කුමක්ද?

**(1)** බාගේශ්‍රී **(2)** ආසාවරී **(3)** භෛරව

**(4)** හංසධ්වනි **(5)** දේස් (...................)

- **පහත සඳහන් ගී පාද දෙක ඇසුරෙන් 21 සිට 23 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**A.** පාට වරුණ පුත පරමණ්ඩල පුත

**B.** බස්ම නම් අසුර රජුගේ සොහොනෙ ඉපදුනේ

**21.** ඉහත ගී පද දෙකෙන් පිළිබිඹු වන රංග ශෛලීන් වන්නේ

**(1)** නූර්ති හා නාඩගම් **(2)** නාඩගම් හා කෝළම් **(3)** සොකරි හා කෝළම්

**(4)** කෝළම් හා නූර්ති **(5)** නාඩගම් හා සොකරි. (...................)

**22.** A අක්ෂරයට අදාල රංග සම්ප්‍රදායේ තනු රටා නිර්මාණය වී ඇත්තේ,

**(1)** උත්තර භාරතීය සංගීතය ඇසුරු කරමින් ය.

**(2)** දක්ෂිණ භාරතීය සංගීතය ඇසුරු කරමින්ය.

**(3)** සබරගමු ශාන්ති කර්මවල නාද මාලා ඇසුරු කරමින් ය.

**(4)** පහතරට ශාන්ති කර්මවල කවි ගායනා ඇසුරු කරමින්ය.

**(5)** උඩරට ශාන්ති කර්ම තනු ඇසුරු කරමින්ය. (...................)

**23.** B අක්ෂරයට අදාල රංග සම්ප්‍රදායේ එන චරිතයක් හා ගීතයක් පිළිවෙලින් ඇතුලත් වරණය වන්නේ කුමක්ද?

**(1)** ගුරු හාමි - වෙදා නටන්නේ **(2)** ලෙංචිනා - මං ලෙස සොබනා

**(3)** ආරච්චිල - සුද්ධෝදන රජුට දාව **(4)** වෙදරාල - ගම්වල හැමතැන

**(5)** සොකරි - මං වගේ පේඩි කතක් මනා (...................)

**24.** Wood wind Reedless Instrument ගණයට අයත් සංගීත භාණ්ඩයක් වන්නේ,

**(1)** ක්ලැරිනට් **(2)** පිකලෝ **(3)** සැක්සෆෝන්

**(4)** ඕබෝ **(5)** බැසුන් (....................)

**25.** තම ඕගන් වාදිත සඳහා සමූහ ගායන අංග ඇතුලත් කරන ලද සුවිශේෂී බටහිර සංගීතඥයා වන්නේ

**(1)** බීතෝවන් **(2)** මොසාට් **(3)** බාක්

**(4)** බලාන්සින් **(5)** චයිකොවස්කි (....................)

**26.** පෙරකදෝරු බෑනා චිත්‍රපටය වෙනුවෙන් ''ආදර නදිය ගලා'' ගීතය නිර්මාණය කළ සංගීත අධ්‍යක්ෂවරයා වන්නේ.

**(1)** මොහොමඩ් ගවුස් මහතා ය. **(2)** ආර්. මුත්තුසාමි මහතා ය.

**(3)** ආනන්ද සමරකෝන් මහතා ය. **(4)** සුනිල් ශාන්ත මහතා ය.

**(5)** බී.ඇස්. පෙරේරා මහතා ය. (....................)

**27.** ''මල්බර හිමිදිරියේ, මැණිකේ ඔබේ සිනාවේ'' වැනි ජනප්‍රිය ගීත ගායනා කරන ලද සංගීත කණ්ඩායම

**(1)** ලොස් කැබලෙරෝස් **(2)** ලා සිලෝනියන්ස් **(3)** මී මැස්සෝ

**(4)** මූන්ස්ටෝන් **(5)** ධර්මරත්න බ්‍රදර්ස් (....................)

**28.** නාද, ස්වර, ස්වර ස්ථාන පිළිබඳ අවබෝධය ඇති වන්නේ,

**(1)** සංගීත රිද්මානුකූල බුද්ධිය නිසාය. **(2)** දෘශ්‍ය අවකාශමය බුද්ධිය නිසාය.

**(3)** තාර්කික ගණිතමය බුද්ධිය නිසාය. **(4)** වාචික භාෂාමය බුද්ධිය නිසා ය.

**(5)** කායික සංචලන බුද්ධිය නිසාය. (....................)

**29.** ස්වර පුවරුවකින් $DF^{\#}B^{b}$ යන ස්වර ත්‍රිත්වය එකවර වැයෙන විට ගොඩනැගෙන සුසංයෝගය වන්නේ,

**(1)** D Major ය. **(2)** D Augmented ය. **(3)** D minor ය.

**(4)** D sustain ය. **(5)** D Diminished ය. (....................)

**30.** Definite Pitch සහ Indefinite Pitch යන වර්ගවලට අදාල වාදන භාණ්ඩ යුගලය ඇතුලත් වරණය වන්නේ,

**(1)** ග්ලොකන්ස්පියල් සහ බේස් ඩ්‍රම් **(2)** ට්‍රම්බෝන් සහ ටියුබා **(3)** ෆ්ලූට් සහ ඩබල්බේස්

**(4)** සයිලෆෝන් සහ චෙලෝ **(5)** ටිම්පනිඩ්‍රම් සහ බැන්ජෝ (....................)

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසුම පිළිතුරු යොදන්න.**

**31.** සංගීත විශාරද ආනන්ද ජයසිංහ මහතා විසින් සම්පාදිත .................................................................... කෘතිය පාසැල් පද්ධතිය තුල ජනප්‍රිය ග්‍රන්ථයක් වන අතර ගාන විද්‍යා ග්‍රන්ථය ....................................................................... සූරීන් විසින් සම්පාදිතය

**32.** ජාවා නැමති උපකරණයකින් වාදනය කරන .................................................................... වාද්‍ය භාණ්ඩය ....................................................................... ශෛලීය වාදන භාණ්ඩයකි.

**33.** **එක්ටැම් ගේ** චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය .................................................................... සූරින් විසින් සිදු කරන ලද අතර **බඹරු ඇවිත්** චිත්‍රපටය වෙනුවෙන් ටී.එම්. ජයරත්නයන් ගැයූ **උදුම්බරා ගීතය** ....................................................................... විසින් සංගීතවත් කරන ලදී.

**34.** තිරිකිට යන පදය දෙවරක් යෙදෙන නිර්දේශිත තාල දෙකක් වන්නේ ....................................................................... තාලය සහ .................................................................... තාලයයි.

**35.** නාඩගම් සඳහා .................................................................... සංගීතය ද නූර්ති සඳහා ....................................................................... සංගීතයේ ආභාෂය ද ලැබී ඇත.

**36.** රත් තං කිට දික් තං යනු .................................................................... වැයෙන තාල පදයක් වන අතර එය ....................................................................... රංග සම්ප්‍රදායේදී භාවිතා වේ.

**37.** ජග්ජිත් සිං .................................................................... ගායන ශෛලිය සඳහා ප්‍රකට වූ අතර උස්තාද් අෆාක් හුසේන් ඛාන් .................................................................... වාදනය සඳහා සුප්‍රසිද්ධ වූ ශිල්පියෙකි.

**38.** කෝළම් රංග ශෛලීය .................................................................... සහ සොකරි නාටකය ....................................................................... යන ස්ථානයන්හි රඟදැක්වන ලදී.

**39.** උත්තර භාරතීය සංගීතයේදී අලුවකින් වැයෙන (Bow) පර්දා සහිත වාද්‍ය භාණ්ඩ දෙකක් ලෙස ....................................................................... සහ ....................................................................හැඳින්විය හැකිය.

**40.** ''මන රංජන දර්ශනීය ලංකා'' ගීතය .................................................................... චිත්‍රපටයට අයත් වන අතර එම චිත්‍රපටයේ සංගීතය අධ්‍යක්ෂණය කර ඇත්තේ ....................................................................විසිනි.

**41.** අඬන හිමාලෙ ........................................................................ වැලපුම් ගීයක් වන අතර ........................................................................ අනාසාතාත්මක වැලපුම් ගීයක් වේ.

**42.** දෙගුණ, තෙගුණ, සිව්ගුණ ආදී වශයෙන් ලයකාරීව ගයනු ලබන ඉපැරණි ගායන ශෛලීන් දෙකක් ලෙස ........................................................................ හා ........................................................................ ගායන ශෛලීන් හැඳින්විය.

**43.** සමප්‍රකෘති රාග යුගලයකට අයත් ම ග (ම) <u>රි</u> ස ස්වර සංගතිය ........................................................................ රාගයට ද ග ම ග, <u>රි</u> ස ස්වර සංගතිය ........................................................................ රාගයට ද අයත් ය.

**44.** මහනුවර යුගයේ දී කවිකාර මඩුව ආශ්‍රිතව පැවති ........................................................................ ට්‍රම්පට්, ත්‍රොම්බෝන් වැනි විදේශීය තූර්ය භාණ්ඩ පවා පරිහරණය කරන ලද අතර ........................................................................ දවුල් තම්මැට්ටම් හොරණෑවලින් සමන්විත ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් ආරම්භ කර ඇති බව කියැවේ.

**45.** තූර්ති සංගීතය සඳහා ........................................................................ වැනි උතුරු ඉන්දියානු සංගීතඥයින් මෙන්ම ........................................................................ වැනි දේශීය සංගීතඥයින් ද දායක විය.

- **අංක 46 සිට 48 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් ස්වර ඛණ්ඩය උපයෝගී කරගන්න.**

(1) (2) (3)

ස̇ නි̇

ම ග , රි ග‿ස , ම ප නි නි ස̇ , ස̇ <u>නි</u> ධ ප , ප ධ ම ග

**46.** ඉහත ස්වර ඛණ්ඩය සඳහා පාදක වී ඇත්තේ ........................................................................ රාගය වන අතර එහි විවාදි ස්වරයක් ලෙස ........................................................................ ස්වරය භාවිත වේ.

**47.** ඉහත ස්වර ඛණ්ඩයට ඉහළින් ඇති අංක (1) දරණ සංකේතය ........................................................................ ලෙස හැඳින්වෙන අතර (2) හා (3) ස්ථානවලදී හැඳින්වෙන කුඩා ස්වර ........................................................................ ලෙස හැඳින්වේ.

**48.** ඉහත ස්වර ඛණ්ඩය සඳහා පාදක වී ඇති රාගය ........................................................................ජාතියට අයත් වන අතර ........................................................................ ගායනය වාදනය කෙරේ.

**49.** Number 38 ප්‍රාග් සංගීත සංධ්වනිය ........................................................................ ගේ නිර්මාණයක් වන අතර Number 6 පැස්ටෝරල් සංගීත සංධ්වනිය ........................................................................ ගේ නිර්මාණයකි.

**50.** අපරදිග බැලේ (Ballet) නාටකයේදී ........................................................................ ප්‍රමුඛ වන අතර අපරදිග ඔපෙරා (Opera) හෙවත් ගීත නාටකයේදී ........................................................................ විශේෂ තැනක් හිමි වේ.